ISSN 1800 - 4067

Founded 1845

# THE ROYAL ASIATIC SOCIETY OF SRI LANKA

## 12th Annual Research Conference
## 28th - 30th March 2019

# ABSTRACTS

Royal Asiatic Society of Sri Lanka
96, Ananda Coomaraswamy Mawatha
Colombo 07, Sri Lanka

## Research Conference Committee

Archt. Ashley De Vos
Dr. Hema Goonatilake
Dr. Seetha I. Wickremasinghe
Dr. T. D. Nishantha Perera
Dr. Mallika Karunaratne
Dr. Wijerathne Bohingamuwa
Dr. Manatunga Jayawardena
Eng. Chandana Jayawardana
Eng. H. Mahinda Goonasekara
Ms. Dilini C. Walisundara
Ms. S. Lawanya Ranasingha
Ms. Hasula Wickremasinghe
Mr. Harsha Soysa
Mr. Dhanesh Wisumperuma
Mr. Muditha Karunamuni

Support Staff

Ms. Sajeeva Weeraratne
Ms. Lahiruni Hewanayaka
Mr. Kalum Priyadharshana

Citation: Royal Asiatic Society of Sri Lanka, 12th Annual Research Conference, 28th to 30th March 2019, Abstracts, Colombo, 2019

Printed by: techno graphics
77, De Soysa Road, Rawatawatte, Moratuwa
▪ 0776000600 ▪ 0773757866
technographics678@gmail.com

ISSN 1800 – 4067

Founded 1845

# THE ROYAL ASIATIC SOCIETY OF SRI LANKA

12th Annual Research Conference
28th – 30th March 2019

# ABSTRACTS

Royal Asiatic Society of Sri Lanka
96, Ananda Coomaraswamy Mawatha
Colombo 07, Sri Lanka

# CONTENTS

Education ........................................................................ 1
Communication and Media ................................................... 17
Sustainable Development .................................................... 42
Science and Technology ...................................................... 53
Language Studies ................................................................ 76
Religion and Philosophy .................................................... 103
Social Sciences ................................................................... 148
Aesthetic Studies ................................................................ 185
Health and Nutrition .......................................................... 213
History ................................................................................ 266
Archaeology ....................................................................... 301

## Royal Asiatic Society of Sri Lanka

## 12th Annual Research Conference

## Thursday 28th to Saturday 30th March 2019

### Opening Ceremony
### Thursday 28th March 2019 at 9.30 a.m

**Keynote Address**

'Sino-Lanka relations in the context of the Indian Ocean geopolitics and changing pattern of world economy'
by Mr. Nihal Rodrigo

**Guest Lecture**

'Sri Lankan Ships in China: What do we know of them?'
by Mr. Somasiri Devendra

at the
Auditorium of the Mahaweli Centre,
96, Ananda Coomaraswamy Mawatha, Colombo 7

Conference Coordinator
Eng. Chandana Jayawardana

ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ සඳහන් දියවැඩියා රෝගය පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්
**An Anthropological Study on Diabetes in Ayurvedic Medical System** 25
C. මුදලිගේ, D. දේවපුර, M.S. හේරත්, N. කාන්තිලතා, N.T. බුද්ධික

**A Study on the Non-Communicable Diseases programme in the Colombo District, Sri Lanka** 26
A. M. Hamdani, S. D. Dharmaratne, S. N. Amarasinghe, L. M. Senanayake

## History

භූමි පත්‍ර තුළින් හෙළි වන මහනුවර සමයේ ආර්ථීක සහ සමාජ සංවිධානය පිළිබඳ අධ්‍යයනයක්
**A Study of the Economic and Social Background of the Kandyan Era revealed through the '*bhūmi patra*'** 2
ඒ. අයි. සත්සරා

හැඩඔය නිම්නයේ පිහිටි කල්‍යාණකණ්ණිකා හෙවත් පානම්පත්තුවේ ආගමික හා සංස්කෘතික පසුබිම පිළිබඳ විමර්ශනයක් (ශාස්ත්‍රවෙල මණිනාග පබ්බත බෝධිගිරි විහාරපරිශ්‍රය ඇසුරින්)
**An Analysis on Religions and Cultural Conditions in Panampattuwa (Special Reference to Shasthrawela Maninaga Pabbatha Bodigiri Vihara complex).** 2
අමිල් ප්‍රසන්න, කසුන් කුමාර පතිරණ, ප්‍රබෝධා සේරසිංහ

පැරණි ශ්‍රීලංකාවේ වහලුන් හා වහල් ක්‍රමය (6 සිට 13 වන සියවස් දක්වා)
**Slaves and Slavery System in Ancient Sri Lanka (from 6th to 13th Century)**
ඩබ්. එම්. කල්පනී ගයාත්‍රිකා වීරසිංහ

# ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ සඳහන් දියවැඩියා රෝගය පිළිබඳ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

# An Anthropological Study on Diabetes in Ayurvedic Medical System

C. මුදලිගේ[1], D. දේවපුර[2], M.S. හේරත්[3], N. කාන්තිලතා[4], N.T.බුද්ධික[5]

## හැඳින්වීම සහ පර්යේෂණ ගැටලුව

ආයුර්වේද වෛද්‍යවිද්‍යාවවූ කලී හෙළ සම්ප්‍රදායික සභ්‍යත්වයෙහි අනාදිමත් කාලයක සිට පැවතෙනු ලබන්නකි. ආයුර්වේදය යනු, පරිසරය සත්ත්වයාගේ පැවැත්මට උපයෝගී කරගන්නා විද්‍යාව ලෙසත් දීර්ඝායුෂ පිළිබඳ අනුශාසනය ලෙසත් හඳුන්වාදී ඇත. අද්‍යතන ශ්‍රී ලංකා සමාජය තුළ උග්‍ර ලෙස ව්‍යාප්තව පවතින බෝනොවන රෝගී තත්ත්වයක් ලෙස දියාවැඩියා රෝගය හැඳින්විය හැක. වයස් භේදයකින් තොරව වර්තමාන සමාජයෙහි කිඳා බැසගත් මෙම රෝගී තත්ත්වය දරුණු රෝගී තත්ත්වයක් බවට පත්ව ඇත. ලාංකික ජනගහනයෙන් මිලියන 4 කට වඩා වැඩි බහුතරයක් මෙම බෝනොවන රෝගී තත්ත්වයෙන් පීඩා විඳිනු ලබයි. මෙය ප්‍රතිශතයක් ලෙස ලාංකික ජනගහනයෙන් 8.5% කි. ආයුර්වේදයෙහි දියවැඩියා රෝගය ප්‍රමේහ රෝගය ලෙස ද හඳුන්වයි. ආයුර්වේදයට අනුව දියවැඩියා රෝගය දෙවැදෑරුම් වේ. එනම් සහජ ප්‍රමේහය සහ අපථ්‍ය ආහාර සේවනය කිරීම හරහා ඇතිවන ප්‍රමේහයයි. සහජ ප්‍රමේහ රෝගී තත්ත්වයෙන් රෝගියාගේ ශරීරය කෘශ සහ රළු වනු ලබයි. අපථ්‍ය ආහාර සේවනය කිරීම හා ප්‍රමේහ තත්ත්වය වැළඳුණු රෝගයාගේ රෝගී ලක්‍ෂණ ලෙස බෙහෙවින් ආහාර පරිභෝජනය, ශරීරය බෙහෙවින් සිනිඳු වීම, බෙහෙවින් සයනයෙහි නිරතවීම. හිඳගෙන සිටීමට ප්‍රිය කිරීම සහ නිදන සුළුවීම ආදිය ආයුර්වේදයේ පෙන්වා දී ඇත. වර්තමාන සමාජය තුළ දියවැඩියා රෝගීන් වැඩි වශයෙන් ආයුර්වේද වෛද්‍ය ක්‍රම සඳහා යොමු වෙමින් පවතී. දියවැඩියා රෝගී තත්ත්වය නිවාරණය හෝ සමනය කිරීම උදෙසා ආයුර්වේද වෛද්‍ය විද්‍යාව කෙතරම් දුරට අද්‍යතන සමාජය හා තදානුබද්ධව පවතී ද යන්න සොයා බැලීම මෙම පර්යේෂණයේ පර්යේෂණ අරමුණ වේ.

---

[1] Department of Anthropology, University of Sri Jayawardenepura
[2] Department of Anthropology, University of Sri Jayawardenepura
(dulshandewapura@gmail.com
[3] Department of Anthropology, University of Sri Jayawardenepura
[4] Department of Anthropology, University of Sri Jayawardenepura
[5] Navinna Ayurveda Hospital.

## පර්යේෂණ ක්‍රමවේදය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයට අයත් පිළියන්දල සහ බණ්ඩාරගම යන ප්‍රදේශයන්හි වෙසෙන ආයුර්වේද වෛද්‍යවරුන් පස්දෙනෙකු සහ ඔවුන්ගෙන් ප්‍රතිකාර ලබන රෝගීන් දසදෙනා බැගින් ගෙන මෙම පර්යේෂණය සිදුකරන ලදී. මෙහිදී පරමාර්ථගත හෝ විනිශ්චමය නියැදි ක්‍රමය උපයෝගී කොටගෙන මෙම පර්යේෂණය සිදුකරන ලදී. දියවැඩියාව සඳහා බටහිර වෛද්‍යක්‍රමය අත්හැර ආයුර්වේද වෛද්‍ය ක්‍රමයට යොමු වූ රෝගී 50 දෙනෙකු සහ ඔවුන්ට ප්‍රතිකාර කරනු ලබන ආයුර්වේද වෛද්‍යවරු පස්දෙනෙකු සංඛ්‍යාත්මක නියැදියක් ලෙස යොදා ගන්නා ලදී. මෙහිදී ප්‍රාථමික මූලාශ්‍ර ලෙසට සම්මුඛ සාකච්ඡා උපලේඛන ක්‍රමය ද, දියවැඩියා රෝගය සම්බන්ධ ලංකාවේ ප්‍රමුඛ පෙළේ ආයුර්වේද වෛද්‍යවරුන් සමඟ සිදුකරන ලද දුරකථන සංවාද ද, ද්විතීයික මූලාශ්‍ර ලෙසට පොත්පත්, ඓතිහාසික ලේඛන, සඟරා, පුවත්පත්, අන්තර්ජාලය මෙන්ම වාර්ෂික වාර්තා ද භාවිතයට ගන්නා ලදී. පර්යේෂණයේදී ලබාගත් දත්තවල ගුණාත්මකභාවය මුඛ්‍ය ලෙස සලකා බැලූ අතර මෙම පර්යේෂණයේදී සීමා ලෙසට ශ්‍රී ලංකාවේ සෑම පළාතක්ම නියෝජනය වන පරිද්දෙන් ආයුර්වේද වෛද්‍යවරුන් ගේ සහය ලබා ගැනීමට නොහැකිවීමත්, අධ්‍යයන වපසරිය පුළුල්වීම, මෙන්ම මූල්‍යමය ප්‍රතිපාදන ද පෙන්වා දිය හැකිය.

## සාකච්ඡාව, ප්‍රතිඵල සහ නිගමනය

හෙළ ගැමිසමාජයේ නිරෝගිමත් දිවි පෙවෙතක් ගත කිරීමට සාම්ප්‍රදායික ආයුර්වේද වෛද්‍ය විද්‍යාව මහත් වූ කාර්යය භාරයක් ඉටුකර ඇත. එමෙන්ම එකල මිනිසාගේ දිවිපැවැත්ම පරිසරය හා තදානුබද්ධ වෙමින්, සරල, හිතකර මෙන්ම පෝෂණදායී ආහාර රටාවකින් සමන්විතව පැවතිණි. නමුදු වර්තමානය වන විට මිනිසා සංකීර්ණ දිවිපෙවතකට අනුගත වීම හරහා මහත් ව්‍යසනයන් රැසක් ළඟා කරගෙන ඇත. එහිදී පරිසරය හා බැඳි සබැඳියාව දුරස්වීම, අසහනකාරීත්වය මෙන්ම අසමතුලිත අපථ්‍ය ආහාර පරිභෝජන රටාවකින් යුක්ත වීම ප්‍රධාන වේ. මිනිසා තම සහජත්වයෙන් මෙන්ම පරිසරයෙන් දුරස් වීම දියවැඩියාව වැනි බෝනොවන රෝගී තත්ත්වයන් උග්‍ර වීමට හේතු වී ඇත. පර්යේෂණයේදී ලබාගත් දත්තවලින් ගම්‍ය වනු ලබන්නේ සාම්ප්‍රදායික ආයුර්වේද වෛද්‍ය ක්‍රමය තුළ මෙම දියවැඩියා රෝගී තත්ත්වය නිවාරණය කිරීමට හෝ පාලනය කිරීමට විවිධ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම රාශියක් පවතින බවය. වර්තමානය වන විට බටහිර වෛද්‍ය ක්‍රමය පසෙකලා දියවැඩියා රෝගී තත්ත්වය නිවාරණය කිරීමට හෝ සමනය කිරීමට සාම්ප්‍රදායික ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර කිරීම උදෙසා මහත් නැඹුරුතාවයක් ඇති බව හඳුනා ගන්නා ලදී. මිනිසා තම සහජත්වය තුළ ජීවත්වෙමින් පරිසරය සහ අන්‍යෝන්‍ය බැඳීමකින් යුතුව පෝෂ්‍යදායි පථ්‍ය මෙන්ම

සමබල ආහාර රටාවකට අනුගත වීම හරහා මෙම උග්‍ර ව්‍යසනයකට තුඩු දී ඇති බෝනොවන රෝගී තත්ත්වයක් වන දියවැඩියා රෝගය නිවාරණය කිරීමට හෝ සමනය කරගැනීමට හැකියාවක් ලැබෙනු ඇත.

**ප්‍රමුඛපද:** Diabetes, Ayurvedic medicine, Treatments.

**ආශ්‍රිත ග්‍රන්ථ**

කුමාරසිංහ, ආරියදාස. (1994), *මාධව නිදානය,* මරදානඃ ශ්‍රී ලංකා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.

කුමාරසිංහ, ආරියදාස. (1981), *ආයුර්වේද සෞඛ්‍ය සංරක්ෂණ විධි,* මරදාන.

බුද්ධදාස, ආර්. (2007), *සුශ්‍රැත සංහිතාව,* ශ්‍රී ලංකා ආයුර්වේද දෙපාර්තමේන්තුවේප්‍රකාශනයකි.

Singh, V. K., Reddy K. R. C. (2015). Manage of Diabetes Mellitus and its Complications by Lodhra, *international Journal of Ayurvedic medicine,* 6 (4): 305-309.

Mahalakshmi, K. M. (2015). Effect of Pramehamihirataila in the management of MadhumehajaPaadadaaha w. s. r. to Diabetic sensory neuropathy, *International Journal of Ayurvedic Medicine,* 6 (4): 317 - 320.